# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2012


**සමුපකාර සේවක කොමිෂන් සභාව**

අංකඃ100 1/1, ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ල,

ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,

කොළඹ - 02

## දර්ශනය

තෘප්තිමත්
සමුපකාරික මානව සම්පතක් නිර්මාණය
කිරීම

# මෙහෙවර

සමුපකාර ව්‍යාපාරයේ තිරසාර පැවැත්ම
උදෙසා එම ක්ෂේත්‍රයෙහි මානව සම්පතෙහි
අභිවෘද්ධිය පිණිස අවශ්‍ය ප්‍රතිපත්ති
සකස්කිරීම.

# සමුපකාර සේවක කොමිෂන් සභාව - වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2012

සමුපකාර සේවකයින්ගේ සේවා සුරක්ෂිතතාව සහ ශුභසිද්ධිය උදෙසා සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් 2012 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ සියළු කාර්යයන් පිළිබඳ විස්තරාත්මක හා සංඛ්‍යාත්මක තොරතුරු ඉදිරිපත්කිරීම මෙම වාර්තාව මඟින් සිදුකර ඇත.

මූලික වශයෙන් පහත සඳහන් පරිච්ඡේදවලින් සමන්විත වන පරිදි මෙම වාර්තාවෙහි අන්තර්ගතය සකස්කර ඇත.

* **පළමු පරිච්ඡේදය**

  සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංයුතිය හා 2012 වර්ෂය තුළ සේවා නියුක්තිය පිළිබඳ කරුණු.

* **දෙවන පරිච්ඡේදය**

  කොමිෂන් සභාවේ විෂය පථයට අයත්, මුදුන් මට්ටමේ සමුපකාර සමිතිවල නාම ලේඛනය හා 2012 වර්ෂය තුළ එම සමිතිවල සේවයේ යෙදී සිටි සේවකයින් පිළිබඳ කරුණු.

* **තුන්වන පරිච්ඡේදය**

  කොමිෂන් සභා කාර්යාලයේ භෞතික හා මූල්‍ය කටයුතු සහ 2012 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් සිදුකරන ලද සමස්ථ කාර්යයන් සමාලෝචනය කිරීම.

## සමුපකාර සේවක කොමිෂන් සභාව ගැන

1971 වර්ෂයේදී සමුපකාර විෂය භාරව සිටි දේශීය විදේශීය වෙළඳ අමාත්‍යතුමා විසින් එවකට මෙරට සමුපකාර ව්‍යාපාරය ප්‍රතිසංවිධානය කිරීමේ අරමුණ ඇතිව පියවර කිහිපයක් ගන්නා ලදී. ඒ අනුව 1972 අංක 12 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා පනත සම්මත වූ අතර, එහි ප්‍රතිපාදන මත සමුපකාර සේවක කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී.

සමුපකාර සේවක කොමිෂන් සභාව රජයේ දෙපාර්තමේන්තුවක් වන අතර අර්ධ අධිකරණමය බලතල සහිත ස්වාධීන ආයතනයකි.සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ විධිවිධාන හා ඒ යටතේ පනවනු ලැබූ 1981.12.01 දිනැති අංක 169/8 දරණ ගැසට් පත්‍රයේ පළකළ රෙගුලාසි මාලාවේ විධිවිධානවලට අනුකූලව සමුපකාර සේවකයින්ගේ විනය, රැකියා සුරක්ෂිතතාව හා සුබසාධනය ආරක්ෂාකර දීම සඳහා මෙම ආයතනය මූලික වශයෙන් කටයුතු කරනු ලැබේ.

මේ සඳහා බොහෝ විට නීතිමය කරුණු පදනම් කරගනිමින් සමුපකාර සේවකයින් වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් සුදුසු විධිවිධාන පැනවීමත් මෙම කොමිෂන් සභාවේ මූලික කාර්ය භාරයට අයත් වන්නේය. තවද පුහුණු වැඩසටහන් මඟින් සමුපකාර ව්‍යාපාරයේ මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා ද කොමිෂන් සභාව දායක වේ.

සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ විධිවිධානවලට අනුකූලව එතෙක් පනවන ලද රෙගුලාසි, කාර්ය විධානයන් හා චක්‍රලේඛ ඒකාබද්ධ කර වත්මන් සමාජ ආර්ථික පසුබිමට උචිත ලෙසත්, වත්මන් කම්කරු නීතීන්ට ගැලපෙන ලෙසත්, සමුපකාර ව්‍යාපාරයේ නව මානයන්ට හා අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙසත් එකම සංග්‍රහයක් ලෙස සමුපකාර සේවක ආයතන සංග්‍රහය 2011 වර්ෂයේ එළිදැක්වීම මෙම කොමිෂන් සභාව විසින් ඉටුකල විශේෂ කාර්යයකි. සමුපකාර සේවකයන්ගේ වැටුප් විෂමතා හා බඳවා ගැනීමේ ක්‍රමවල පැවති විෂමතා අවම කිරීම සඳහා කොමිෂන් සභාව විසින් 2007/5 දරණ වැටුප් චක්‍රලේඛය නිකුත් කළ අතර, එය 2008.01.01 දින සිට ක්‍රියාත්මක කරන ලදී. එය ද වර්තමානයට ගැලපෙන පරිදි යළි සංශෝධනය කිරීම සඳහා කටයුතු කරමින් පවතී.

# කාර්යයන්

--

* සමුපකාර සමිතිවලට සේවකයින් බඳවා ගැනීමේදී උසස් කිරීමේදී සහ ඔවුන්ට හිමි පාරිතෝෂික දීමනා ලබාදීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීම.

* සමුපකාර සමිතිවල තනතුරුවලට පත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීම හා එබඳු තනතුරුවලට අදාළ වැටුප් පරිමාණයන් නියමකිරීම.

* සේවක ආරවුල් විසඳීම, අභියාචනා විභාග කිරීම සහ නියෝග ක්‍රියාත්මක කිරීම පැහැර හරින සමුපකාර සමිතිවලට එරෙහිව නීතිමය පියවර ගැනීම.

* කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරෙන සේවක අභියාචනා සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම.

* සේවකයින් සම්බන්ධ විනය කාර්යාවලියේදී සමුපකාර සමිති විසින් අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටිය/ක්‍රියාපටිපාටින් තීරණය කිරීම.

* මානව සම්පත් සංවර්ධනය කිරීමේ සාකච්ඡා සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

# පටුන

**පිටුව**

**I. පරිච්ඡේදය**


- කොමිෂන් සභාවේ සංයුතිය,පාලන කටයුතු, හා සංවිධාන ව්‍යුහය .............................. 13-14
- කාර්යමණ්ඩලය හා 2012 වර්ෂයේ සේවා නියුක්තිය ...................................................... 14-15


**II. පරිච්ඡේදය**


- මුදුන් මට්ටමේ සමුපකාර සමිති හා එම සමිතිවල
  2012 වර්ෂයේ සේවා නියුක්තිය ................................................................................... 19-21


**III. පරිච්ඡේදය**


- 2012 වර්ෂයේ භෞතික හා මූල්‍ය කාර්යඵල සාධනය .................................................... 25-26
- වර්ෂය තුළ කරන ලද සාමාන්‍ය හා විශේෂිත කාර්යයන් සමාලෝචනය .................... 27-37

## I පරිච්ඡේදය

- ❖ කොමිෂන් සභාවේ සංයුතිය, පාලන කටයුතු, හා සංවිධාන ව්‍යුහය

- ❖ කාර්යමණ්ඩලය හා 2012 වර්ෂයේ සේවා නියුක්තිය

# සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංයුතිය හා පාලන කටයුතු

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතෙහි 4 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුව සමුපකාර විෂය භාර ඇමතිවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ. එම සාමාජිකයින් තිදෙනාගෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් පත් කරන අතර, එකී සාමාජිකයින් තිදෙනාම තම පත්වීමේ දින සිට අවුරුදු 03 ක කාලසීමාවක් සිය ධූරයන් දැරිය යුතු වේ. එසේ වුවද සාමාජිකයෙකුගේ ඉල්ලා අස්වීම, ඇමතිවරයා විසින් එකී ධූරයෙන් ඉවත් කිරීම, මිය යෑම වැනි කරුණු වලදී හිස් වූ පුරප්පාඩුවක් පිරවීමට තුන් අවුරුදු කාලයෙන් ඉතිරිව ඇති කාලයට වෙනත් සුදුසු අයෙකු ඇමතිවරයා විසින් පත් කරනු ලැබේ.

2012 වර්ෂයේ දී කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස නීතීඥ ඩී.එම්. අරුණ කීර්ති දසනායක මහතා කටයුතු කළ අතර, සෙසු සභිකයින් ලෙස නීතීඥ ඩබ්ලිව්.මංජුල විජේවර්ධන මහතාත් එම්.ඩබ්ලිව්.එච්.කමල් ජයරත්න මහතාත් කටයුතු කරන ලදී.

1972 සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙම කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ  නිලධාරියකු පත් කළ යුතුය. එකී ලේකම්වරයා මෙම දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා ද වේ.


2006.08.21 දින සිට කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමුවන පන්තියේ නිලධාරියකු වන පී.එච්. ආනන්ද මහතා කටයුතු කළේය. 2007.10.16 දින සිට වෙළඳ, අලෙවි සංවර්ධන හා පාරිභෝගික සේවා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට පත් වූ ඒ මහතා එදින සිට 2012.08.05 දින දක්වා මෙම කොමිෂන් සභාවේ ලේකම් තනතුරේ වැඩ බැලීමේ පදනම මත රාජකාරි ඉටු කළේය. 2012.08.06 දින සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමුවන පන්තියේ නිලධාරියකු වන සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ඩබ්.ඒ.ධම්මික රාජපක්ෂ මහතා කොමිෂන් සභාවේ වැඩ බලන ලේකම් ලෙස කටයුතු කරයි.

1972 සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයෙහි සෙසු සාමාජිකයින් ආණ්ඩුවේ මාරුවීම් සහිත සේවාවන්ගෙන් පත් කරනු ලැබේ.

1972 සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 12 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ වියදම් වාර්ෂික විසර්ජන පනත යටතේ වෙන් කරනු ලබන මුදල් වලින් සිදු කෙරේ. 2012 වර්ෂයේ වැය ශීර්ෂ 302 යටතේ විසර්ජන පනතින් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

## කාර්ය මණ්ඩලය හා 2012 වර්ෂයේ සේවා නියුක්තිය

### සමුපකාර සේවක කොමිෂන් සභා සංවිධාන සැලැස්ම



## 2012 වර්ෂයේ සේවා නියුක්තිය

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2012.12.31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ලේකම් | 01 | 01 (වැඩ බලන) | - |
| ගණකාධිකාරී (නි/ලේකම්-මුදල්) | 01 | 01 | - |
| නීති නිලධාරී | 01 | - | 01 |
| පරිපාලන නිලධාරී (රාජ්‍ය කළමණාකාර සහකාර - අධි ශ්‍රේණිය) | 01 | 01 | - |
| රාජ්‍ය කළමණාකාර සහකාර (I/II/III ) | 08 | 08 | - |
| රියදුරු | 03 | 01 | 02 |
| කාර්යාල කාර්ය සහායක (I/II/III) | 03 | 01 | 02 |
| සනීපාරක්ෂක කම්කරු | 01 | 01 | - |
| **එකතුව** | **19** | **14** | **05** |

## ස්ථාන මාරු වී ගිය සහ ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්

## ලේකම්

* **මෙම කොමිෂන් සභාවේ වැඩ බලන ලේකම් ලෙස කටයුතු කළ සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් පී.එච්. ආනන්ද මහතා වෙනුවට, 2012.08.06 දින සිට එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ඩබ්.ඒ. ධම්මික රාජපක්ෂ මහතා වැඩ බලන ලේකම් ලෙස පත්කර ඇත.**

## අනෙකුත් නිලධාරීන්

| නම | තනතුර | ස්ථාන මාරු වී ගිය දිනය | ස්ථාන මාරුවී පැමිණි දිනය |
|---|---|---|---|
| ඒ. ටී. රණසිංහ මෙනවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර I | 2012.01.01 | - |
| ජේ.කේ.ආර්.පී. ප්‍රේමලාල් මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2012.01.01 | - |
| අයි.එම්.එස්.ජේ. ඉලංකෝන් මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර III | - | 2012.01.02 |
| ඒ.පී.එන්. සිරිවර්ධන මහතා | කාර්යාල කාර්ය සහයක II | 2012.09.28 | - |
| එච්.ආර්.ටී ප්‍රසාද් මහතා | රියදුරු | 2012.10.02 | - |

## II පරිච්ඡේදය

- **මුදුන් මට්ටමේ සමුපකාර සමිති හා එම සමිති වල 2012 වර්ෂයේ සේවා නියුක්තිය**

# මුදුන් මට්ටමේ සමුපකාර සමිති

සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අධීක්ෂණයට යටත් වන ජාතික මට්ටමේ සමුපකාර සමිතිවල සිටින සේවකයින්ගේ සේවාවන්ට අදාළ වන කරුණු පිළිබඳව නියාමනය කිරීම මෙම කොමිෂන් සභාවට පැවරී ඇත. සමුපකාර සේවකයින්ගේ සේවා ප්‍රශ්න විසඳීම පමණක් නොව තනතුරු සඳහා, සුදුසුකම් තීරණය කිරීම, වැටුප් ප්‍රතිශෝධනය කිරීම, වැනි කටයුතු ද මෙම කොමිෂන් සභාව මඟින් ඉටුකරනු ලැබේ. මේ හැරෙන්නට අවශ්‍ය අවස්ථාවන්හිදී පළාත්බද සමුපකාර සේවා කොමිෂන් සභාවලට යම් යම් පැහැදිලි කිරීම් හා උපදෙස් ලබාදීම ද ජාතික වශයෙන් පොදු ඒකාග්‍රතාවකින් යුතුව කටයුතු කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම් සිදුකිරීමද මෙම කොමිෂන් සභාව මඟින් ඉටු කරනු ලැබේ. පහත සඳහන් සමුපකාර සමිතිවල සේවකයින්ගේ සේවා සම්බන්ධ සියළුම කටයුතු මෙම කොමිෂන් සභාව මඟින් නියාමනය කරනු ලැබේ.

**මුදුන් මට්ටමේ සමුපකාර සමිති වල 2012 වර්ෂයේ සේවානියුක්තිය (යාවත්කාලීන වූ)**

| | සමිතියේ නම | සේවක යින් ගණන |
|---|---|---|
| | **සමුපකාර සංගම්** | |
| 01 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | 59 |
| 02 | සී/ස ශ්‍රී ලංකාවේ සණස මහා සංගමය | 18 |
| 03 | සී/ස ශ්‍රී ලංකා පේෂකර්ම සමුපකාර සමිති සංගමය | 05 |
| 04 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | 102 |
| 05 | සී/ස ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | - |
| 06 | සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය | 03 |
| 07 | සී/ස ශ්‍රී ලංකා තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිති මහා සංගමය | 01 |
| 08 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය | 14 |
| 09 | සී/ස ශ්‍රී ලංකා ආයතනයික සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති මහා සංගමය | - |
| 10 | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය | 162 |
| 11 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | 25 |
| 12 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය | 41 |
| 13 | සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණසේවා සමුපකාර සමිති සංගමය | 13 |
| 14 | සී/ස. ශ්‍රී ලංකා සම්පත් කළමනාකරණ සමුපකාර සන්ධානය | 03 |

| දීප ව්‍යාප්ත ණය දෙන සමිතිය | | |
|---|---|---|
| 15 | සී/ස. අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 601 |
| 16 | සී/ස. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය. | 76 |
| 17 | සී/ස. දුම්රිය ස්ථානාධිපති හා ලිපිකරු සමුපකාර ණය දෙන සමිතිය | 04 |
| 18 | සී/ස. තැපැල් හා විදුලි සංදේශ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 35 |
| 19 | සී/ස. බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සමුපකාර ණය දෙන සමිතිය | 01 |
| 20 | සී/ස සණස සංවර්ධන බැංකුවේ සේවක ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | - |
| 21 | සී/ස රජරට විශ්ව විද්‍යාලීය සමුපකාර සමිතිය | - |
| 22 | සී/ස වරාය නැව් සේවා සමුපකාර සමිතිය | - |
| 23 | සී/ස යහජීවන සමුපකාර සමිතිය | - |
| 24 | සී/ස ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ සමස්ත සේවකයින්ගේ ණය දෙන සමිතිය | - |
| 25 | සී/ස. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය | 02 |
| 26 | සී/ස. සමෘධි සංවර්ධන, කෘෂිකාර්මික සහකාර නිලධාරීන්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 05 |
| 27 | සී/ස. රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය සමුපකාර ණය ගනුදෙනු පිළිබඳ සමිතිය | 06 |
| 28 | සී/ස රාජ්‍ය සේවා උපාධිධාරී ස.ණ.ස. | - |
| 29 | සී/ස. දුම්රිය මාර්ග වැඩ දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය | 01 |
| 30 | සී/ස වරාය අධිකාරිය සේවක සමුපකාර බැංකුව | 18 |
| 31 | සී/ස. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය | ලැ.නො |
| 32 | සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරිකිරීම් සමුපකාර ණය දෙන සමිතිය | 23 |
| 33 | සී/ස. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු සේවකයින්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 02 |
| 34 | සී/ස. ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 02 |
| 35 | සී/ස. ශ්‍රී ලංකාවේ කාන්තා සංවර්ධන සේවා සමුපකාර සමිතිය | 42 |
| 36 | සී/ස. මහජන බැංකු සේවක සමුපකාර ණය දෙන සමිතිය | 05 |
| 37 | සී/ස. කොළඹ මහාරෝග්‍යශාලිය සේවක ස.ණ.ස | 10 |
| 38 | සී/ස. ලංගම සේවක සකසුරුවම් හා සුබසාධක සමුපකාර සමිතිය | 06 |
| 39 | සී/ස. රාජ්‍ය සේවා සමුපකාර ණයදීමේ හා ඉතිරිකිරීමේ සමිතිය. | 32 |
| 40 | සී/ස. ස.තො.ස සේවකයින්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 04 |


| | | |
|---|---|---|
| 41 | සී/ස. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සුභසාධක ස.ණ.ස | **19** |
| 42 | සී/ස. ශ්‍රී ලංකා මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකවරුන්ගේ සමුපකාර සකසුරුවම් ණය දෙන සමිතිය | **ලැ.නො** |
| 43 | සී/ස. වතු සේවා නිලධාරීන්ගේ නිවාස සමුපකාර සමිතිය | **01** |
| 44 | සී/ස සමස්ථ ලංකා මාධ්‍යවේදීන්ගේ සකසුරුවම් හා සුභසාධක සමුපකාර සමිතිය. | |
| 45 | සී/ස. සමුපකාර දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ සමුපකාර ණය දෙන සමිතිය | **-** |
| | **වෙනත් සමිති** | |
| 46 | සී/ස බන්ධනාගාර සේවා සැපයුම් හා ගොඩ. ඉදි. කම්. සමු. සමිතිය | **-** |
| 47 | සී/ස සමස්ථ ලංකා කෘෂිකාර්මික සමුපකාර සමිතිය | **-** |
| 48 | සී/ස නිවාස හා දේපළ සමුපකාර සමිතිය | **-** |
| 49 | සී/ස. සමස්ත ලංකා සුළු හා මධ්‍යම පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය | **01** |
| 50 | සී/ස. ශ්‍රී ලංකා වානේ කර්මාන්ත සමුපකාර සමිතිය | **08** |
| 51 | සී/ස. සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | **07** |
| 52 | සී/ස. මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | **14** |
| 53 | සී/ස. සමස්ත ලංකා විචිත්‍ර පැළැටි හා උඩවැඩියා සමුපකාර සමිතිය | **12** |
| 54 | සී/ස. සමස්ත ලංකා මාදැල් හිමියන්ගේ ධීවර සමුපකාර සමිතිය | **-** |

# III පරිච්ඡේදය


- 2012 වර්ෂයේ ක්‍රියාකාරකම් සාරාංශය හා මූල්‍ය කාර්යඵල සාධනය

- වර්ෂය තුළ කරන ලද සාමාන්‍ය හා විශේෂිත කාර්යයන් සමාලෝචනය


# 2012 වර්ෂයේ ක්‍රියාකාරකම්වල සාරාංශය



## පැමිණිලි/ඉල්ලීම් අභියාචනා විභාග කිරීම




## පැමිණිලි/ඉල්ලීම් අභියාචනා විභාග කිරීම 2011 වසරට සාපේක්ෂව





| වර්ෂය | අපේක්ෂිත | ඉටුකළ |
|---|---|---|
| 2011 | - | 508 |
| 2012 | 520 | 331 |

**වියදම් පිළිබඳ වාර්තාව 2012**
**ශීර්ෂය - 302**
**සමුපකාර සේවක කොමිෂන් සභාව**

## 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන සහ වියදම් සාරාංශය (වැය ශීර්ෂය-302)


| වැය විෂය | විස්තරය | 2012 ඇස්තමේන්තුව | අතිරේක ප්‍රතිපාදන (මු.රෙ66 මාරුකිරීම්) | ශුද්ධ ප්‍රතිපාදන | කාර්තුමය වියදම් | | | | මුළුවියදම් එකතුව | ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 1වනකාර්තුව | 2වනකාර්තුව | 3වනකාර්තුව | 4වනකාර්තුව | | |
| පුද්ගල පඩිනඩි | | 5,150,000.00 | 39,000.00 | 5,189,000.00 | 1,069,613.81 | 1,275,326.39 | 1,277,296.43 | 1,273,627.83 | 4,895,864.46 | 193,135.54 |
| 1001 | වැටුප් හා වේතන | 3,210,000.00 | -521,000.00 | 2,689,000.00 | 613,421.07 | 628,150.88 | 677,150.64 | 647,833.69 | 2,566,556.28 | 122,443.72 |
| 1002 | අතිකාල හා වෙනත් දීමනා | 320,000.00 | 0 | 320,000.00 | 22,437.87 | 113,562.92 | 18,224.40 | 32,314.23 | 186,539.42 | 133,460.58 |
| 1003 | වෙනත් දීමනා | 1,620,000.00 | 560,000.00 | 2,180,000.00 | 433,754.87 | 533,612.59 | 581,921.39 | 593,479.91 | 2,142,768.76 | 37,231.24 |
| | ගමන් වියදම් | 305,000.00 | 0 | 305,000.00 | 12,548.50 | 71,860.50 | 181,411.00 | 13,088.00 | 278,908.00 | 26,092.00 |
| 1101 | ගමන් වියදම්-දේශීය | 90,000.00 | 0 | 90,000.00 | 8,848.50 | 39,360.50 | 2,611.00 | 13,088.00 | 63,908.00 | 26,092.00 |
| 1102 | ගමන් වියදම්-විදේශීය | 215,000.00 | 0 | 215,000.00 | 3,700.00 | 32,500.00 | 178,800.00 | 0 | 215,000.00 | 0 |
| | සැපයීම් සේවා | 845,000.00 | 11,000.00 | 856,000.00 | 112,112.00 | 215,665.11 | 190,951.16 | 231,343.49 | 750,071.76 | 105,928.24 |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 255,000.00 | 0 | 255,000.00 | 36,227.00 | 34,308.91 | 43,399.76 | 85,997.89 | 199,933.56 | 55,066.44 |
| 1202 | ඉන්ධන | 550,000.00 | 0 | 550,000.00 | 75,885.00 | 153,455.80 | 132,495.00 | 137,615.00 | 499,450.80 | 50,549.20 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 40,000.00 | 11,000.00 | 51,000.00 | 0 | 27,900.40 | 15,056.40 | 7,730.60 | 50,687.40 | 312.60 |
| | නඩත්තු වියදම් | 945,000.00 | 0 | 945,000.00 | 246,164.97 | 91,355.00 | 293,585.05 | 48,782.50 | 679,887.52 | 143,912.48 |
| 1301 | වාහන | 710,000.00 | 0 | 710,000.00 | 236,714.97 | 91,355.00 | 290,505.05 | 47,215.00 | 665,790.02 | 44,209.98 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 215,000.00 | 0 | 215,000.00 | 8,600.00 | 0 | 3,080.00 | 0 | 11,680.00 | 203,320.00 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 20,000.00 | 0 | 20,000.00 | 850.00 | 0 | 0 | 1,567.50 | 2,417.50 | 17,582.50 |
| | ගිවිසුම්ගත සේවා | 3,755,000.00 | -315000.00 | 3,440,000.00 | 804,561.53 | 819,443.33 | 712,065.24 | 751,063.59 | 3,087,133.69 | 352,866.31 |
| 1401 | ප්‍රවාහන | 360,000.00 | 0 | 360,000.00 | 90,000.00 | 90,000.00 | 60,000.00 | 6,000.00 | 246,000.00 | 114,000.00 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 315,000.00 | 0 | 315,000.00 | 62,963.02 | 70,197.07 | 55,512.07 | 55,290.21 | 243,962.37 | 71,037.63 |
| 1403 | විදුලිය හා ජලය | 350,000.00 | 0 | 350,000.00 | 36,960.01 | 45,750.66 | 65,446.57 | 67,997.78 | 216,155.02 | 133,844.98 |
| 1404 | බදු කුළී සහ පළාත්පාලන ආයතන බදු | 2,100,000.00 | -315,000.00 | 1,785,000.00 | 446,199.60 | 446,199.60 | 446,199.60 | 446,199.60 | 1,784,798.40 | 201.60 |
| 1405 | වෙනත් | 630,000.00 | 0 | 630,000.00 | 168,438.90 | 167,296.00 | 84,907.00 | 175,576.00 | 596,217.90 | 33,782.10 |
| | මාරුකිරීම් | 60,000.00 | 0 | 60,000.00 | 6,181.94 | 6,134.68 | 6,086.12 | 6,036.21 | 24,438.95 | 35,561.05 |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය | 60,000.00 | 0 | 60,000.00 | 6,181.94 | 6,134.68 | 6,086.12 | 6,036.21 | 24,438.95 | 35,561.05 |
| **පුනරාවර්තන වියදම් එකතුව** | | **11,060,000.00** | **0** | **10,795,000.00** | **2,251,182.75** | **2,479,785.01** | **2,661,395.00** | **2,323,941.62** | **9,716,304.38** | **857,495.62** |
| 2102 | ගෘහභාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 60,000.00 | 265,000.00 | 325,000.00 | 60,000.00 | 0 | 0 | 262,650.00 | 322,650.00 | 2,350.00 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 75,000.00 | 350,000.00 | 425,000.00 | 410,060.00 | 0 | 0 | 0 | 410,060.00 | 14,940.00 |
| | හැකියා වර්ධනය | 100,000.00 | 0 | 100,000.00 | 11,500.00 | 0 | 23,582.00 | 14,000.00 | 49,082.00 | 29,768.00 |
| 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 100,000.00 | 0 | 100,000.00 | 11,500.00 | 0 | 23,582.00 | 14,000.00 | 49,082.00 | 50,918.00 |
| මූලධනවියදම්එකතුව | | 235,000.00 | 0 | 850,000.00 | 481,560.00 | 0 | 23,582.00 | 276,650.00 | 781,792.00 | 47,058.00 |
| මුළුවියදම්එකතුව | | 11,295,000.00 | 0 | 11,645,000.00 | 2,732,742.75 | 2,479,785.01 | 2,684,977.00 | 2,600,591.62 | 10,498,096.38 | 1,146,903.62 |

# 2012 වර්ෂයේ පුනරාවර්තන වියදම් සාරාංශය





| | 1 කාර්තුව | 2 කාර්තුව | 3 කාර්තුව | 4 කාර්තුව |
|---|---|---|---|---|
| පුද්ගලපඩිනඩි | 1,069,613.81 | 1,275,326.39 | 1,277,296.43 | 1,273,627.83 |
| ගමන් වියදම් | 12,548.50 | 71,860.50 | 181,411.00 | 13,088.00 |
| සැපයීම් සේවා | 112,112.00 | 215,665.11 | 190,951.16 | 231,343.49 |
| නඩත්තු වියදම් | 246,164.97 | 91,355.00 | 293,585.05 | 48,782.50 |
| ගිවිසුම්ගත සේවා | 804,561.53 | 819,443.33 | 712,065.24 | 751,063.59 |
| මාරුකිරීම් | 6,181.94 | 6,134.68 | 6,086.12 | 6,036.21 |

# පුනරාවර්තන වියදම් සාරාංශය
# 2011 වර්ෂයට සාපේක්ෂව





| | 2011 | 2012 |
|---|---|---|
| පුද්ගලපඩිනඩි | 4,316,174.00 | 4,895,864.46 |
| ගමන් වියදම් | 253,662.65 | 278,908.00 |
| සැපයීම් සේවා | 472,524.84 | 750,071.76 |
| නඩත්තු වියදම් | 754,156.75 | 679,887.52 |
| ගිවිසුම්ගත සේවා | 3,738,064.00 | 3,087,133.69 |
| මාරුකිරීම් | 25,175.22 | 24,438.95 |

# 2012 වර්ෂයේ මූලධන වියදම්





| | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය |
|---|---|---|---|
| 1 කාර්තුව | 60 000.00 | 410060.00 | 11500.00 |
| 2 කාර්තුව | 0.00 | 0.00 | 0.00 |
| 3 කාර්තුව | 0.00 | 0.00 | 23582.00 |
| 4 කාර්තුව | 262,650.00 | 0.00 | 276650.00 |

# 2012 වර්ෂයේ මූලධන වියදම් සාරාංශය
# 2011 වර්ෂයට සාපේක්ෂව




| | 2011 | 2012 |
|---|---|---|
| පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 74350.00 | 49,082.00 |
| ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 33869.20 | 322,650.00 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | - | 4,10,060.00 |




| කාර්තුව | වියදම |
|---|---|
| 1 කාර්තුව | 2,732,742.75 |
| 2 කාර්තුව | 2,479,785.01 |
| 3 කාර්තුව | 2,684,977.00 |
| 4 කාර්තුව | 2,600,591.62 |

## 2012 වර්ෂයේ කරන ලද කාර්යය සමාලෝචනය

මෙම කොමිෂන් සභාව 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ සංස්ථාපනය වී තිබේ.එතෙක් කොමිෂන් සභාවට පමණක් සීමා වී තිබූ සමුපකාර සේවකයින්ගේ සේවා ගැටළු විභාග කිරීම, 1992 අංක 51 දරන සමුපකාර සේවක කොමිෂන් සභා (සංශෝධිත) පනත නිසා කම්කරු විනිශ්චය සභාව වෙත යොමු කිරීමට ද සමුපකාර සේවකයින්ට අවස්ථාව සැලසුණි..එසේම ආණ්ඩුකම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 09 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ 17 වන වගන්තියට අනුව සමුපකාර විෂයය පළාත් සභාවලට පැවරී තිබීම නිසා මෙම කොමිෂන් සභාවේ විෂය සීමාව ජාතික හා මුදුන් මට්ටමේ සමුපකාර සමිති හා සංගම් වලට සීමා වී තිබේ.

### ❖ 2012 වර්ෂය තුළ කරන ලද කාර්යභාරය

### * කොමිෂන් සභා රැස්වීම් පැවැත්වීම

මෙම දෙපාර්තමේන්තුවට සමුපකාර සේවකයින්ගෙන් ලැබෙන පැමිණිලි, අභියාචනා, ඉල්ලීම් ආදිය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු සමුපකාර සේවක කොමිෂන් සභා පනත සහ අදාළ වන වෙනත් රෙගුලාසි අනුව තීන්දු තීරණ ලබාදීම සාමාන්‍ය ක්‍රමයයි.මෙම වර්ෂයේ පවත්වන ලද රැස්වීම් ගණන 13කි.

අවශ්‍ය වන අවස්ථාවන්හිදී සේව්‍ය සේවක දෙපක්ෂය සමඟ සාකච්ඡා කොට දෙපාර්ශවයේම එකඟතා අනුව දෙපාර්ශවයේම අයිතිවාසිකම් සුරැකෙන අයුරින් තීන්දු ලබාදීම සිදුවේ.

කොමිෂන් සභාවට ලැබෙන සේවක පැමිණිලි හා අභියාචනා සංඛ්‍යාව අනුවත්, ඒවායේ සංකීර්ණතාව අනුවත්, කොමිෂන් සභා රැස්වීම් පවත්වන අවස්ථා ගණන තීරණය වේ.

### * කොමිෂන් සභා නියෝග ක්‍රියාත්මක නොකරන සමුපකාර සමිතිවලට විරුද්ධව නඩු පැවරීම.

සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 11 වන වගන්තියෙන් පැවරී ඇති බලතලවලට අනුව සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සේවක අභියාචනා හා වෙනත් අදාළ වන කරුණු සම්බන්ධයෙන් සමුපකාර සමිතිවලට නියෝග නිකුත්කරනු ලැබේ.

එලෙස කොමිෂන් සභාව විසින් සමුපකාර සමිතියකට දෙනු ලබන නියෝගයන් ක්‍රියාත්මක කිරීමට සමිතිය බැඳී සිටී. යම් හෙයකින් එම නියෝගය ක්‍රියාත්මක කිරීමට සමිතිය විසින් පැහැර හරින්නේනම් ඉහත කී පනතේ 35 වගන්තිය යටතේ එම සමුපකාර සමිතියට විරුද්ධව නීති මඟින් කටයුතු කිරීමට කොමිෂන් සභාවට හැකිය.

2012 වර්ෂයේදී කොමිෂන් සභාව විසින් පනවනු ලැබූ නියෝග හා තීන්දු සමිති සහ සේවකයින් විසින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. එනිසා 2012 වසර තුළදී කොමිෂන් සභා නියෝග හෝ

තීන්දු ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් සමුපකාර සමිතිවලට විරුද්ධව නඩු පැවරීම් කිසිවක් සිදු නොවීය.

එසේවුවත්, අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතියේ සේවකයකු වූ ඒ. ධර්මරත්න මහතා එකී සමිතිය විසින් ස්ථානමාරු කර තිබූ අතර, එම ස්ථාන මාරුව පිළිනොගැනීම නිසා සේවය අවසන් කිරීමට එරෙහිව ඒ මහතා විසින් කම්කරු විනිශ්චය සභාවට පැමිණිලි කර තිබුණි. එම පැමිණිල්ලේ පළමුවන විත්තිකරු ලෙස සේවා යෝජක සමුපකාර සමිතියත් දෙවැනි විත්තිකරු ලෙස මෙම සමුපකාර සේවක කොමිෂන් සභාවත් නම්කර තිබුණි.

මෙම නඩුවට අදාලව කොමිෂන් සභාව විසින් විරෝධතා ගොනු කිරීමටත් පෙර සේවක මහතා සහ සමිතිය විසින් ඇති කරගත් සමථයක් අනුව අදාල නඩුව ඉල්ලා අස්කර ගෙන තිබුණි.

## * කොමිෂන් සභාව පාර්ශවකරුවකු වන නඩු පිළිබඳ ක්‍රියාකිරීම.

සමුපකාර සේවකයින් ඇතැම් අවස්ථාවල සිය සේවා යෝජක සමිතියට එරෙහිව රීට් ආඥා ලබා ගැනීම සඳහා අභියාචනාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කරන අවස්ථා තිබේ. එවැනි පෙත්සම්වල මෙම කොමිෂන් සභාව, එහි ලේකම් සහ කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සෙසු සාමාජිකයින් වගඋත්තරකරුවන් ලෙස නම්කරන අවස්ථා ඇත. තව ද, සේවකයින් විසින් කොමිෂන් සභා තීරණය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා අධිකරණයට පැමිණිලි ඉදිරිපත්කරන අවස්ථා ද දැකිය හැකිය. එවැනි නඩුවලදී කොමිෂන් සභාව සාක්ෂිකරුවකු ලෙස මැදිහත් කරගනී. එවැනි නඩු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| නඩු අංකය | පැමිණිල්ල | විත්තිය | 2012.12.31 දිනට තත්ත්වය |
|---|---|---|---|
| HC/WA/02/2012 | සී/ස සමුපකාර අලෙවි සංගමය | ටී.ඥාණවතී හා සමුපකාර සේවක කොමිෂන් සභාව | පැමිණිල්ල ඉල්ලා අස්කරගෙන ඇත. |
| 3267,3275,3276, 3277,3278,3279, 3280,3281,3284 | සී/ස කම්මල්පත්තු විවිධ සේවා සමුපකාර සමිතිය විසින් සේවයෙන් ඉවත් කළ සේවක පිරිසක් | සී/ස කම්මල්පත්තු පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය. (කොමිෂන් සභාව සාක්ෂි සඳහා කැඳවා තිබුණි.) | මාරවිල මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වේ. |
| 3265,3266,3269, 3270,3271,3273, 3274 | එම | සී/ස කම්මල්පත්තු පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය. (කොමිෂන් සභාව සාක්ෂි සඳහා කැඳවා තිබුණි.) | කොමිෂන් සභා තීරණය බල ගන්වා තීන්දුව දී ඇත. ඊට එරෙහිව සමිතිය විසින් අභියාචනා තර ඇත. |

## * සමුපකාර සේවක විනය පරීක්ෂණ මෙහෙයවීම සඳහා විනය පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම

1972 අංක 12 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ සම්පාදිත රෙගුලාසි මාලාවේ අංකඃ 92 වගන්තිය ප්‍රකාරව සමුපකාර සමිතිවල සේවකයින්ගේ විනය පරීක්ෂණ කටයුතු පැවැත්වීම සඳහා විනය පරීක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු පත්කර ඇත.

## * 1972 අංක 12 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම

1972 අංක 12 සමුපකාර සේවක කොමිෂන් සභා පණත වර්තමාන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම සඳහා සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ නීති උපදේශක ඩී.එච්. වික්‍රමාරච්චි මහතාගේ සභාපතිත්වයෙන් යුත් කොමිෂන් සභාවක් පත්කළ අතර, සංශෝධිත කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

## * 2012 වර්ෂය තුළ තනතුරු සඳහා බඳවා ගැනීම්

| | සමුපකාර සමිතිය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණය දෙන සමිතිය | කළමනාකරණ සහකාර | 01 |
| 02 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | අපනයන කළමනාකරු | 01 |
| 03 | සී/ස තැපැල් ටෙලිකොම් සේවක සමුපකාර සමිතිය | මූල්‍ය කළමනාකරු | 01 |
| 04 | සී/ස තැපැල් ටෙලිකොම් සේවක සමුපකාර සමිතිය | පරිපාලන නිලධාරී | 01 |
| 05 | සී/ස සමුපකාර අලෙවි සංගමය | වෙළඳ සහයක | 01 |
| 06 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | වෙළඳ නියෝජිත | 01 |
| 07 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගගමය | කර්මාන්තශාලා කළමනාකරු | 01 |
| 08 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | කළමනාකරණ සහකාර | 01 |
| 09 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | සාමාන්‍යාධිකාරී | 01 |
| 10 | සී/ස අධ්‍යාපන සමුපකාර සමිතිය | විශේෂඥ පදනමේ උපදේශක | 01 |
| 11 | සී/ස අධ්‍යාපන සමුපකාර සමිතිය | - | 01 |
| 12 | සී/ස තැපැල් ටෙලිකොම් සේවක සමුපකාර සමිතිය | පරිගණක ක්‍රියාකරු | 01 |
| 13 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගගමය | කර්මාන්තශාලා කළමනාකරු | 01 |
| 14 | සී/ස අධ්‍යාපන සමුපකාර සමිතිය | උපදේශක තනතුරු | 01 |
| 15 | සී/ස මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | ගණකාධිකාරී තනතුර | 01 |
| 16 | සී/ස රාජ්‍ය සේවා සමුපකාර සමිතිය | උපදේශක | 01 |
| 17 | සී/ස අධ්‍යාපන සමුපකාර සමිතිය | උපදේශක | 01 |
| 18 | සී/ස ලංගම සේවක සමුපකාර සකසුරුවම් හා සුබසාධක සමුපකාර සමිතිය | පරිපාලන නිලධාරී | 01 |
| 19 | සී/ස රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය සමුපකාර ණය ගනුදෙනු පිළිබඳ සමිතිය | කළමනාකරණ සහකාර | 01 |
| 20 | සී/ස සමුපකාර අලෙවි සංගමය | බර වාහන රියදුරු | 01 |
| 21 | සී/ස කොළඹ මහාරෝග්‍යශාලීය ඉතිරිකිරීමේ හා ණයදීමේ සමුපකාර සමිතිය | කා.කා.ස | 01 |
| 22 | සී/ස අධ්‍යාපන සමුපකාර සමිතිය | කළමනාකරණ සහකාර | 04 |
| 23 | සී/ස ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය | සාමාන්‍යාධිකාරී | 01 |
| 24 | සී/ස ශ්‍රී ලංකා ග්‍රාමීය බැංකු සමුපකාර සමිතිය | උපදේශක | 01 |
| 25 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | ගණකාධිකාරී | 01 |

❖ පුහුණු වැඩමුළු - 2012 (පළාත් සඳහා)

| අනු අංකය | වැඩමුළුවේ නම | පැවැත්වූ දිනය | පළාත | සහභාගි ත්වය | වියදම රු. |
|---|---|---|---|---|---|
| 01 | සමුපකාර සේවක ආයතන සංග්‍රහය පිළිබඳ පළාත් මට්ටමින් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව | 2012.01.28 | නැගෙනහිර | 60 | 62 000.00 |
| 02 | සමුපකාර සේවක ආයතන සංග්‍රහය පිළිබඳ පළාත් මට්ටමින් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව | 2012.05.12 | මධ්‍යම | 20 | 1,10 000.00 |

❖ පුහුණු වැඩමුළු - 2012 (මුදුන් මට්ටමේ සමිති සඳහා)

| අනු අංකය | වැඩමුළුවේ නම | පැවැත්වූ දිනය | සහභාගිත්වය | වියදම රු. |
|---|---|---|---|---|
| 01 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය හා ග්‍රාමීය බැංකු මහා සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය හා සේවකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව | 2012.09.14 | 40 | 3500.00 |
| 02 | නිවාඩු හා සේවක වරප්‍රසාද පිළිබඳව සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සමිති සේවකයින් හා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩමුළුව | 2012.10.10 | 80 | 24 400.00 |
| 03 | සී/ස ලංගම සේවා සමුපකාර සමිතියේ සේවකයින් හා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩමුළුව | 2012.10.18 | 18 | 3000.00 |
| 04 | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සමුපකාර සමිතියේ සේවකයින් හා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩමුළුව | 2012.11.13 | 100 | 8700.00 |









